7.

1283/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ නිවාස නොමැති බවට හඳුනාගත් පවුල් සංඛ්‍යාව;

(ii) මාතර දිස්ත්‍රික්කයේ අර්ධ ස්ථිර හා ස්ථිර නිවාසවල ජීවත්වන පවුල් සංඛ්‍යාව;

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2013 සිට 2016 දක්වා මාතර දිස්ත්‍රික්කයේ රජයේ ආධාර මත ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව;

(ii) වර්ෂ 2014 සිට 2016 දක්වා මාතර දිස්ත්‍රික්කයේ රජයේ නිවාස ණය මත ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව;

(iii) 2014, 2015 සහ 2016 වර්ෂවල මාතර දිස්ත්‍රික්කයේ නිවාස සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1343/'16

ගරු හේෂාන් විතානගේ මහතා,— කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ළමා අපයෝජන හා ලිංගික අතවර හේතුවෙන් ලංකාවේ කාන්තාවන් සහ ළමුන් විශාල පිරිසක් අධිකරණය ඉදිරියට පැමිණෙන බවත්;

(ii) ඔවුන් විවෘත අධිකරණය තුළදීත්, ජනමාධ්‍ය හරහාත් වරින් වර වක්‍ර ලෙස නැවත එවැනි වූ අපයෝජනයට හා අතවරයට ගොදුරුවන බවත්;

(iii) එමඟින් ඔවුන් සමාජගත වීමේදී ප්‍රශ්න රාශියකට සහ විවිධ මානසික දුබලතාවයන්ට ලක් වී පීඩා විඳින බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) උක්ත හේතුව මත ලංකාවේ ළමා හා කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විශේෂිත අධිකරණයක් පිහිටුවීමට යෝජනා කරන්නේද;

(ii) එවැනි තත්ත්වයකදී ඔවුන්ගේ අනාගත අභිවෘද්ධිය පිණිස ජනමාධ්‍ය වෙත මාධ්‍ය වාර්තාකරණයේ සීමාවන් පැනවීමට සැලසුමක් තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

844/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කතරගම, නල්ලූර්, මුන්නේශ්වරම්, තිරුකෝනේෂ්වරම් හා තිරුකේතීශ්වරම් යන ස්ථානයන්හි පිහිටි ශ්‍රී ලාංකීය හින්දු ආගමිකයන්ගේ ප්‍රධාන පූජනීය ස්ථාන වන්දනා කිරීමට විදේශිකයන්ද පැමිණෙන බවත්;

